ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - 05 වන මට්ටම

පරිපාලන නීතිය- LLU 5709/LWU 3311

අවසාන පරීක්ෂණය -2022/2023

කාලය : පැය තුන (03) යි.

---

දිනය : 2024 මාර්තු 20 — වේලාව : පෙ.ව 9.30 -ප.ව 12.30

මුළු ප්‍රශ්න ගණන - අටයි 08.

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩුකරනු ලැබේ.

1. සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය (WBB) යනු 2022 සෙලනියා සුබසාධන පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. පනත යටතේ සුබසාධන ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ඇති තෝරාගත් පුද්ගලයන් සඳහා සුබසාධන ප්‍රතිලාභ අනුමත කිරීමට එයට බලය ඇත්තේය. පනතේ 5 වැනි වගන්තියේ සඳහන් වන්නේ මාසික ආදායම රුපියල් 25,000/= ට අඩු ඕනෑම පුද්ගලයකු පනත යටතේ සුබසාධන ප්‍රතිලාභ ලබා ගැනීමට සුදුසුකම් ලබන බවයි.එම පනතේ තවදුරටත් දැක්වෙන්නේ WBB විසින් ඔවුන් වෙත ලැබුණු සියලුම අයදුම්පත් පනත යටතේ සංස්ථාපනය කර ඇති තේරීම් කමිටුව වෙත යොමු කළ යුතු බවත්, එහිදී එවැනි අයදුම්කරුවන්ගේ ආදායම්, වත්කම් සහ බැරකම් සම්බන්ධ සියලු තොරතුරු විමර්ශනය කරනු ලබන බවත්ය. තේරීම් කමිටුවෙන් වාර්තාව ලබා ගැනීමෙන් පසුව පමණක් අනුමැතිය ලබා දීමට පනතේ 7 වැනි වගන්තියට අනුව WBB වෙත බලය පවරා ඇත්තේය. තවද, පනතේ 8 වැනි වගන්තියේ සඳහන් වන්නේ නියමිත තේරීම් සිදුකල යුතු වන්නේ නිර්ණායක සහ තේරීම් කමිටුවේ නිරීක්ෂණ අනුව බවයි. තවදුරටත් WBB හි තීරණය අවසාන සහ තීරණාත්මක විය යුතු බව ද මෙම වගන්තියේ සඳහන් වේ.
   පසුගියදා සිය රැකියාවෙන් ඉල්ලා අස් වූ සිව්දරු මවක් වන නාමලී සුභසාධන ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා WBB වෙත අයදුම්පතක් ඉදිරිපත් කළාය. පසුව නාමලී විසින් පහත සඳහන් දේ අනාවරණය කර ගත්තාය;

   අ) WBB විසින් තේරීම් කමිටුවෙන් වාර්තාව ලබා නොගෙනම ඇයගේ අයදුම්පත ප්‍රතික්ෂේප කර ඇත.

ආ) ඇයගේ අයදුම්පත ප්‍රතික්ෂේප වී ඇත්තේ ඇය රැකියාවෙන් ඉල්ලා අස්වීම සඳහා හේතු දැක්වීමට අපොහොසත් වීම නිසාය. එය නියමිත තේරීම් නිර්ණායකවලට ද ඇතුලත් නොවූවකි.

ඇ) නගරයේ සිල්ලර වෙළඳසැලක හිමිකරු වන බන්දුලගේ අයදුම්පත්‍රය WBB විසින් කමිටුවේ වාර්තාවක් ලබා නොගෙන අනුමත කර ඇත්තේය.

මණ්ඩලයේ තීරණය අභියෝගයට ලක් කිරීමට ඇයට කිසියම් පදනමක් තිබේද යන්න පිළිබඳව නාමලී ඔබේ උපදෙස් පතයි. නාමලීට උපදෙස් දෙන්න.

අදාළ පරිපාලන නීති මූලධර්ම සහ නඩු තීන්දු නීතිය ඇසුරෙන් ඔබේ පිළිතුර සනාථ කරන්න.

**(ලකුණු 20)**

2. ජෝන් ලිබරල්වාදී ස්වාධීන පක්ෂය (LIP) නියෝජනය කරන සියන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකි. පසුගිය දිනක පක්ෂ රැස්වීමකදී පක්ෂ ව්‍යවස්ථාවට පටහැනිව යම් යම් ක්‍රියාවල නිරත වන බව දක්වමින් LIP නායකයා විසින් ජෝන්ට චෝදනා කරන ලද්දේය. 2024 ජනවාරි 12 වැනි දින පරීක්ෂණයක් පැවැත්වීමට පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය තීරණය කළ අතර පරීක්ෂණයට දිනකට පෙර චෝදනා පත්‍රය යවන ලදි. එම චෝදනා පත්‍රයේ සඳහන් වූයේ ඔහු විසින් LIP සංවිධානයේ නායක රමීන්ව ජනාධිපතිවරණයට අපේක්ෂකයෙකු ලෙස නම් කර තිබියදී වුවද, එවක ජනාධිපති මාර්ෂල් හමුවී ඉදිරි ජනාධිපතිවරණය ජයග්‍රහණය කරවන බවට සහතික වූ බවයි. ජෝන් පරීක්ෂණ කමිටුවෙන් පහත කරුණු ඉල්ලා සිටියේය.

අ) ඔහුගේ පරීක්ෂණය සඳහා සූදානම් වීමට ප්‍රමාණවත් කාලයක් නොමැති බැවින් පරීක්ෂණය කල් දැමීමට.

ආ) නීතිමය නියෝජනයක් ලබා ගැනීමට සහ

ඇ) සාක්ෂිකරුවන් ගෙන් හරස් ප්‍රශ්න ඇසීමට.

කෙසේ වෙතත්, ඉහත ඉල්ලීම් කිසිවක් පිළිගැනීමට කමිටුව කැමැත්තක් දැක්වූයේ නැත. ජෝන් කෘත්‍යාධිකාරී මණ්ඩලය ඉදිරියේ පෙනී සිටීමට පෙර ඔහු පක්ෂයේ සාමාජිකත්වයෙන් නෙරපා හරින ලදී.

ජෝන් නෙරපා හැරීමට ආසන්නතම හේතුව ලෙස LIP හි මාධ්‍ය ප්‍රකාශක පවසන ලද්දේ LIP හි බොහෝ සාමාජිකයින් මත්ද්‍රව්‍ය ජාවාරම් සම්බන්ධ නඩු වලට සම්බන්ධ බවට ඔහු විසින් ජාත්‍යන්තර ගුවන් විදුලි සංස්ථාවට (IBC) කරන ලද ප්‍රකාශයයි. ජෝන් චෝදනා කළේ ඔහුගේ IBC මාධ්‍ය සාකච්ඡාව සම්බන්ධයෙන් කිසිදු පැමිණිල්ලක් ගැන තමාට දැනුම් නොදුන් බවයි. පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය පරිපාලන නීතියේ මූලධර්මවලට අනුකූලව පරීක්ෂණය සිදු කර තිබේද යන්න පිළිබඳව ජෝන් ඔබේ උපදෙස් පතයි.

ජෝන්ට උපදෙස් දෙන්න. **(ලකුණු 20)**

3. පරිසර ආරක්ෂණ අධිකාරියේ (EPA) වගකීම වන්නේ පාරිසරික රෙගුලාසි බලාත්මක කිරීම සහ පාරිසරික දූෂණ පාලන ක්‍රියාමාර්ගවලට අනුකූල වීම සහතික කිරීමයි. කෙසේ වෙතත්, ප්‍රාන්තයේ ප්‍රධාන නගරයේ පිහිටා ඇති රසායනික නිෂ්පාදන කම්හලක් නිරන්තරයෙන් විමෝචන ප්‍රමිතීන් උල්ලංඝනය කරමින් අවට පරිසරය දූෂණය කරමින් මහජනතාවට හානියක් සිදු කරයි. මෙම කර්මාන්තශාලාවෙන් තෙල් හා අන්තරායකර ද්‍රව්‍ය සෘජුවම අසල පවතින්නාවූ ගංගාවකට මුදා හැරීම නිසා පානීය ජලය අපවිත්‍ර වී ඇති බවත්, ෆොසිල ඉන්ධන දහනය කිරීමෙන් වාතයට අහිතකර වායූන් නිකුත්ව ඇති බවටත් ප්‍රදේශවාසීහු චෝදනා කරති. පාරිසරික රෙගුලාසි දැඩිව ක්‍රියාත්මක කරන ලෙසත් කර්මාන්ත ශාලාවට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් පරිසර උපදේශක කණ්ඩායමක් වන "ටීම් ග්‍රීන්"( Team Green) සහ ප්‍රදේශවාසීන් කණ්ඩායමක් EPA වෙතින් නැවත නැවතත් ඉල්ලා සිටියහ. කොපමණ ඉල්ලීම් කළද EPA විසින් කර්මාන්ත ශාලාවට එරෙහිව කිසිදු පියවරක් ගෙන නොමැත. "ටීම් ග්‍රීන්"( Team Green) සහ ප්‍රදේශවාසීන් කණ්ඩායමක් EPA ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට තීරණය කර ඇත.

(අ) EPA ට එරෙහිව ඔවුන්ට කිසියම් නීතිමය ක්‍රියාමාර්ගයක් ආරම්භ කළ හැකිද යන්න "ටීම් ග්‍රීන්"( Team Green) විසින් ඔබෙන් විමසයි. ඔවුන්ට උපදෙස් දෙන්න. **(ලකුණු 05)**

(ආ) බලපෑමට ලක් වූ පාර්ශ්වයන් සඳහා පිළියමක් ලබා දීමට මෙම නඩුවේදී අධිකරණය විසින් සලකා බලන සාධක විශ්ලේෂණය කරන්න. නඩු තීන්දු නීතිය ඇසුරෙන් ඔබේ පිළිතුර සනාථ කරන්න. **(ලකුණු 15)**

4. (අ) නයිඩා ගුවන් සේවා අධිකාරී (NAA) පනතේ 10 වැනි වගන්තියට අනුව ගුවන් සේවිකාවකගේ විශ්‍රාම වයස අවුරුදු 35 ලෙස නියම කර ඇත. පනතේ 11 වැනි වගන්තියේ සඳහන් වන්නේ කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ මතය අනුව අයදුම්කරුගේ වෛද්‍ය යෝග්‍යතාවයට යටත්ව එය වසර 40 දක්වා දීර්ඝ කළ හැකි බවයි. NAA පනත යටතේ ස්ථාපිත වෛද්‍ය මණ්ඩලයෙන් වෛද්‍ය වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව පමණක් සේවා දිගුවක් ලබා දීමට කළමනාකාර අධ්‍යක්ෂවරයාට බලය පැවරෙන බව එම රෙගුලාසියේ වැඩිදුරටත් සඳහන් වේ. කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ තීරණය අවසාන සහ තීරණාත්මක විය යුතු අතර කිසිදු අධිකරණයකදී ප්‍රශ්න නොකළ යුතු බව පනතේ වැඩිදුරටත් සඳහන් වේ.

35 හැවිරිදි ගුවන් සේවිකාවක් වන සොනාලි සේවා දිගුවක් ලබා ගැනීම සඳහා අයදුම්පතක් ඉදිරිපත් කළාය. එහෙත් කළමනාකාර අධ්‍යක්ෂවරයා වෛද්‍ය මණ්ඩලයෙන් වෛද්‍ය වාර්තාවක් ලබා නොගෙනම ඇයගේ අයදුම්පත ප්‍රතික්ෂේප කළේය. ඔහු තම තීරණයට හේතු කිසිවක් දක්වා නැත.

කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ තීරණය අධිකරණයකදී අභියෝගයට ලක් කළ හැකිද යන්න පිළිබඳව සොනාලි ඔබෙන් උපදෙස් පතයි. නයිඩා අර්ථ නිරූපණ පනතේ විධිවිධාන ශ්‍රී ලංකාවේ 1972 අංක 18 දරන අර්ථනිරූපන (සංශෝධන) පනතට සමාන යැයි උපකල්පනය කරන්න. සොනාලිට උපදෙස් දෙන්න. **(ලකුණු 12)**

(ආ) පරිපාලන ක්‍රියාමාර්ග පිළිබඳ අධිකරණ සමාලෝචනය සීමා කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් අනුගමනය කරනු ලබන ක්‍රමවේදයන් සාකච්ඡා කරන්න. **(ලකුණු 08)**

5. "සියලු ව්‍යවස්ථාපිත බලතලවලට නීතිමය සීමාවන් ඇත; සැබෑ ප්‍රශ්නය වන්නේ අභිමතය පුළුල්ද පටුද යන්න සහ නීතිමය රේඛාව ඇඳිය යුත්තේ කොතැනද යන්නයි" සහ එම ප්‍රශ්න තීරණය කිරීමේ වගකීම පැවරෙන්නේ අධිකරණයටය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබා දී ඇති බලතල සහ අභිමතය සම්බන්ධයෙන් ගත් කල, ව්‍යවස්ථාදායකයේ හෝ විධායකයේ දූරාචාරයන් හෝ අයථාභාවිතාවන් වැළැක්වීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම අධිකරණයේ විශේෂ වගකීමකි. මෙම මූලධර්මවලට යම් ව්‍යතිරේකයක් පැහැදිලිව සහ ප්‍රකාශිතව සඳහන් කළ යුත්තේය."

<u>ප්‍රේමචන්ද්‍ර එදිරිව මේජර් මොන්ටේගු ජයවික්‍රම සහ තවත්</u> *අය*, 1994 (2) Sri L. R. 90.

අභිමතානුසාරී බලය සම්බන්ධව අධිකරණ පාලනයේ පසුබිම ඇසුරින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

ඔබේ පිළිතුර අදාළ නඩු තීන්දු නීතිය ඇසුරෙන් සනාථ කරන්න. **(ලකුණු 20)**

6. (අ) සිම්ලන්ඩ් තේ මණ්ඩලය යනු 1990 සිම්ලන්ඩ් තේ වතු පනත යටතේ ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි. වෙනත් කරුණු අතර කුඩා පරිමාණ තේ නිෂ්පාදකයින්ට සම්බන්ධ කාරණා නියාමනය කිරීම සඳහා ද මෙම පනත බලතල ලබා දෙයි. පනතේ 8 වැනි වගන්තියට අනුව, මූල්‍ය කටයුතු, ගාස්තු අය කිරීම සහ දඩ පැනවීම සම්බන්ධයෙන් එහි බලතල ක්‍රියාත්මක කිරීමේදී, මණ්ඩලය විෂය භාර අමාත්‍යවරයාගේ නිශ්චිත උපදෙස්වලට යටත් විය යුත්තේය. පනතේ 10 වැනි වගන්තියේ වැඩිදුරටත් සඳහන් වන්නේ තේ මණ්ඩලයේ තීරණයෙන් මාසයක කාලයක් තුළ මණ්ඩලයේ තීරණ සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන ඕනෑම පාර්ශ්වයකට අභියාචනා මණ්ඩලයට අභියාචනා කළ හැකි බවයි. තේ මණ්ඩලයේ සභාපතිවරයා විසින් 2024 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් නියෝග නිකුත් කර ඇත.

(i) සිම්ලන්ත තේ මණ්ඩලය විසින් නිශ්චිතව දක්වා ඇති ප්‍රමිතියට අනුව තේ ඇසුරුම් නොකිරීමේ දඩය 50% කින් වැඩි කිරීම.

(ii) තේ මණ්ඩලය තීරණය ලබාදුන් දින සිට දින දාහතරක් ඇතුළත ඕනෑම පැමිණිල්ලක් කළ යුතුය.

වසර 50ක පමණ කාලයක සිට විවිධ රටවලට තේ අපනයනය කිරීමේ නිරතව සිටින සීමා සහිත සමාගමක් වන 'Herbal Tea' සමාගම තේ මණ්ඩලයේ නියෝගවල වලංගුභාවය අභියෝගයට ලක් කිරීමට අපේක්ෂා කරයි.

මෙම සමාගමට උපදෙස් දෙන්න.

ඔබේ පිළිතුර අදාළ පරිපාලන නීති මූලධර්ම සහ නඩු තීන්දු නීතිය ඇසුරෙන් සනාථ කර යුතුය.

**(ලකුණු 10)**

(ආ) අභිනියෝජන ව්‍යවස්ථාවන්හි වාසි සහ අවාසි සාකච්ඡා කර, පරිපාලනය ඵලදායී සහතික කිරීම සඳහා එහි කාර්යක්ෂමතාවය ඇගයීමට ලක්කරන්න. **(ලකුණු 10)**

7. "පරිපාලනයට එරෙහිව සහනයක් සෙවීමට අපේක්ෂා කරන පැමිණිලිකරුවෙකුට මැන්ඩමස්, සර්ටියෝරාරි සහ තහනම් ආඥාවන් යන පරමාධිකාරී ප්‍රතිකර්ම වටා වර්ධනය වී ඇති තාක්ෂණික සීමාවන් බරපතල බාධාවක් වේ. ප්‍රකාශන ආඥාවන් භාවිතා කිරීමෙන් ඒවා බොහෝ දුරට වළක්වා ගත හැකි බව අපි විශ්වාස කරමු."

G.J Borrie Advantages of Declaratory Judgement in Administrative Law

ඉහත ප්‍රකාශය ඇසුරෙන් පරමාධිකාරී රිට් ආඥාවන්ට (prerogative writs) පටහැනිව ප්‍රකාශන ආඥාවන්හි (declaratory orders) ඇති වාසීන් විවේචනාත්මකව ඇගයීමට ලක් කරන්න.

**(ලකුණු 20)**

8. පහත සඳහන් ඒවායින් ඕනෑම දෙකක් **(02)** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(අ) පක්ෂග්‍රාහීත්වයට එරෙහි රීතිය. (Rule against bias)

(ආ) රිට් ආඥාවන්හි අභිමතානුසාරී ස්වභාවය.

(ඇ) අධිකරණ බලයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පදනම.

**(ලකුණු 10x2=20)**

***සියළුම හිමිකම් ඇවිරිණි***